# බිංකුණ්ඩා

## අහිංසක කපටියා



උසෙළි දම්සි රාජපක්ෂ

කෘතියේ නම

# බිංකුණ්ඩා

## අහිංසක කපටියා

කතෘගේ නම

උසෙළි දම්සි රාජපක්ෂ

කෘතියේ නම

**බිංකුණ්ඩා** - අහිංසක කපටියා

කතෘගේ නම

## උසෙලි දම්සි රාජපක්ෂ

කතෘගේ වෙනත් කෘති

පළමු දිගහැරීම - උම්බලගේ කතාව

දෙවන දිගහැරීම - බිංකුණ්ඩා ( අහිංසක කපටියා)

පාසල - මහාමායා බාලිකා විදුහල මහනුවර

ඉගෙනුම ලබන පන්තිය - 8 - G ශ්‍රේණිය

කෘතිය පළ කරන දිනය - 2026/05/10

ISBN අංකය - 978-624-211-139-1

# පිදුම

මට විවිධ අදහස් ලබා දුන් මාගේ ආදරණීය අම්මාටත්,

මට අවශ්‍ය වූ සියලු කටයුතුවලදී උදවු කළ මාගේ ආදරණීය තාත්තාටත්,

නිරන්තරයෙන් මා ළඟ හිඳිමින් මා ශක්තිමත් කළ මගේ මල්ලිටත්, ආච්චිටත්....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මම දම්සි. මගේ මල්ලි ධීර. ඉතින් අපි දෙන්නා එක දවසක් එළියේ ඇවිදිමින් ඉන්න කොට මල්ලි දැක්කා පොඩි වළවල් ටිකක්. “අක්කේ මේ මොනව ද?” කියලා මල්ලි ඇහුවා. “මල්ලි මම හිතන්නේ මේ බිංකුණ්ඩෙක්ගේ වළවල් ටිකක්”, මම දන්න තරමින් මල්ලිට කියා දුන්නා. ඔන්න ඉතින් ඊට පස්සේ මිදුල අතුගගා හිටපු අපේ අම්මාට අපි දෙන්නාගේ කතාව ඇහිලා එතනට ආවා. “මොනව ගැන ද ඔයාලා මේ කතා කරන්නෙ?” අම්මා ඇහුවා. “ආ... අම්මේ, මේ මොනවා ද? බිංකුඩු වළවල් නේ ද?” මම ඇහුවා. “ඔව්..ඔව් ඔය බිංකුඩු වළවල් තමයි”. අම්මා කිවුවා. “මම බිංකුණ්ඩා ගැන ඒතරම් දෙයක් දන්නේ නෑ පුතේ, ඒ වුණාට ඔයාලට ඉස්කෝලේ විද්‍යාව ටීචර්ගෙන් මේ ගැන අහන්න පුලුවන්, පොත් කියවන්න පුලුවන්, මම ඔයාලට පොඩි සෙල්ලමක් කියා දෙන්නම්. මේක අපි පොඩි කාලේ කරපු සෙල්ලමක්.” අම්මා කිවුවා. “අනේ අම්මේ, අපිට ඒක කියා දෙන්නකෝ” අපි දෙන්න ම එකවර කිවුවා.



“ආ... හරි , හරි මම කියා දෙන්නම්. ඔයාලා ඔයාලාගේ චූටි ඇඟිල්ලක් ඔය වළක් ඇතුළට දාලා හෙමිහිට කරකවන්න.එතකොට ඒ වළ අස්සෙ ඉන්න බිංකුණ්ඩා හෙමිහිට එළියට එනවා. එතකොට ඔයාලට පුලුවන් එයාට රිදෙන්නේ නැති වෙන්න එයාව ඔයාලගේ අත්ල උඩ තියාගන්න. ඊට පස්සේ ඔයාගේ ඇඟිල්ල, අත්ල උඩ රවුමට යවන ගමන් මෙන්න මේක කියන්නකෝ.”

බිංකුණ්ඩෝ බොල බිංකුණ්ඩෝ


තෝත් නටාපිය මාත් නටාන්නම්

බිංකුණ්ඩෝ බොල බිංකුණ්ඩෝ

"එතකොට ඒ බිංකුණ්ඩා ඔයාලාගේ අත් උඩ රවුමට නටාවි," කියා අම්මා හිණාවුණා. "ආනේ ෂෝක්නේ.... අනේ අක්කේ අපි ඒක දැන්ම කරමුකෝ අක්කේ..," කියමින් මල්ලි උඩ පැන්නා. "හා... හා... හරි කරමු," මම කිවුවා. දැන් බිංකුණ්ඩා එළියට ගන්නකම් අපි දෙන්නට ඉවසිල්ලක් නෑ.



මුලින් ම මම අම්මා කිවුව විදියට කරලා බැලුවා. ඒත් හරි ගියේ නෑ. “මල්ලි බිංකුණ්ඩා එන්නේ නෑනේ එළියට” කියලා මම මල්ලිට කිවුවා. “කෝ ඉන්න, මම බලන්න,” මල්ලි කිවුවා. “අන්න , අන්න මොකෙක් ද එළියට එනවා ! ” මම කෑ ගැහුවා.



ඔන්න ඉතින් ඊට පස්සේ අපි දෙන්නා එකතු වෙලා බිංකුණ්ඩාව එළියට ගත්තා. මම බිංකුණ්ඩාව මල්ලිගේ අත්ල උඩ තිබ්බා. ඔන්න ඊට පස්සේ මල්ලි අම්මා කියාදුන්න විදියට සිංදුව කිය කියා ඇඟිල්ල එයාගේ අත්ල උඩ රවුමට යැවුවා. මෙන්න පුදුම වැඩක්!!! බිංකුණ්ඩා නටන්න පටන් ගත්තා. මල්ලී ඇඟිල්ල වටේට කරකවද්දි ඌත් පිටිපස්සට පිටිපස්සට වටේට කැරකුණා. “අනේ මල්ලී මේ බලන්න, ඌ නටනවා.” “ම්....ම්.... හෙට අපි තාත්තත් එක්ක පුස්තකාලෙට යමු, ගිහින් බිංකුණ්ඩා ගැන තවත් තොරතුරු හොයමු.” මම කිවුවා. “ඔව්, දැන් නිවාඩු කාලෙනේ, ඒ නිසා අපි යමු තාත්තත් එක්ක හෙටම පුස්තකාලෙට.” මල්ලිත් කිවුවා.


මම හිතුවා අදත් මේ බිංකුණ්ඩා ගැන තොරතුරු ටිකක් හොයන්න. මම මල්ලිත් එක්ක කෘමි සතුන් ගැන විස්තර තියෙන පොතක් හොයා ගත්තා. ඒ පොත ලියලා තියෙන්නේ මාර්ටින් වික්‍රමසිංහ මාමා. ඒ පොතේ තිබුණ කරුණු ටිකක් මම ඔයාලට කියන්නම්.

ඒ තමයි,

1. බිංකුණ්ඩා කියන්නේ මාංශ භක්ෂක සතෙක්.
2. ඌටත් ජීවන චක්‍රයක් තියෙනවාලු.
3. ඌ බිත්තර දානවලු.
4. ඒවායින් බිංකුණ්ඩෙක් එළියට එනවාලු.
5. එයා ටික කාලෙකට පස්සේ කෝෂයක් හදනවලු.
6. අන්තිමෙට ඒ කෝෂෙන් බත්කූරෙක් වගේ සතෙක් එළියට ඇවිත් පියාඹලා යනවාලු.
7. ඊට පස්සේ ඌ වැඩිහිටියෙක් කියලයි සැලකෙන්නේ.

# පුදුමයි නේද?

# බිංකුණ්ඩාගේ ජීවන චක්‍රය




ඔන්න ඉතින් ඊළඟ දවසේ මමයි මල්ලියි තාත්තත් එක්ක පුස්තකාලයට ගියා.

“අක්කේ, අක්කේ මේ බලන්නකෝ මේ පොතේ තියෙන දේ...”

“ඇයි මොකක් ද තියෙන්නේ මල්ලි?”

මේකේ තියෙනවා, බිංකුණ්ඩා ආහාරයට ගන්නේ කෘමීන් කියලා. එයා තමන්ගේ ගොදුරු පහසුවෙන්ම සොයා ගන්නලු ලිස්සන වැලි සහිත වළක් සාදා ගන්නේ .

“ඈ...! එහෙම ද? ඉතින් ඉතින් ?”

“ඊට පස්සේ ඒ වළ එයාගේ ගෙදර බවට පත්වෙනවලු. මෙයා මේ වළ ඇතුළේ හැංගිලා ඉන්නවලු. කුඹියෙකු හෝ වෙනත් කුඩා කෘමියෙකු ලිස්සන සුළු වළ තුළට වැටුණොත්, ඒ කෘමියාට එළියට යන්න අමාරුලු, වැලි ලිස්සන නිසා.”

“අම්මෝ !! මාර කපටි සතෙක්නේ....!”

“ඒ විතරක් නෙවෙයි, මේ වළට වැටෙන සතුන්ට එළියට යන්න නොදී බිංකුණ්ඩා ඒ සතුන්ට වැලිවලින් ගහනවලු. එතකොට ම එළියට යන්න උත්සහ කරමින් හිටිය සත්තු ආයෙත් වළ ඇතුළට ම වැටෙනවලු.”

“ඉතින් ඊට පස්සේ මල්ලි?”

“ඉතින් වළට වැටෙන කෘමියාගේ ඇඟේ තියෙන යුෂ සේරම මේ කපටි බිංකුණ්ඩා බීලා ඒ හිස් කෘමි ශරීරය වළෙන් පිටතට විසි කරනවලු. ඉතින් බිංකුණ්ඩා කියන්නේ සත්ත්ව ලෝකයේ හරි භයානක සතෙක් නේ ද අක්කේ? ”

ඔව් මල්ලි, ඔය පොඩි පොඩි කුඹි එහෙම මේ බිංකුණ්ඩාට ගොඩක් බය ඇති. ආ....! මගේ පොතෙත් ඕක තිබුණා. මේකේ තවත් විස්තරයක් තියෙනවා.

"ඒ මොකක් ද ඒ අක්කේ" ?

"ඒ තමයි, අපේ අම්මා කියා දුන්න විදියට අපි අපේ ඇඟිල්ල වළවල් ඇතුළට දාලා රවුමට කරකවද්දි, ඌ වළෙන් එළියට එන්නේ පොඩි කෘමියෙක් වළ ඇතුළට වැටිලා දඟලනවා කියලා හිතාගෙනලු."

"ආ...! එහෙම ද ? "

“හ්ම්... අපි දැන් මේ විස්තර ටික අම්මාටත් කියමු මල්ලි.”

“දැන් අපි යමු තාත්තේ.”

බිංකුණ්ඩා ගැන ගොඩක් තොරතුරු කියවූ අපි දෙන්නා පුස්තකාලයෙන් එළියට පැමිණ ගෙදරට ගියේ කපටි බිංකුණ්ඩා ගැන අම්මාට කියන තුරු නොඉවසිල්ලෙනි.

“අම්මේ...අපි ආවෝ” කියාගෙන මමයි මල්ලියි ගෙදර ඇතුළට ගියා. ආ... ආව ද ? කියාගෙන අම්මා කුස්සියෙන් පිටතට ආවා.

“අම්මේ අපිට පුස්තකාලයෙන් ගොඩක් තොරතුරු හොයා ගන්න පුළුවන් වුණා.” මම කිවුවා.


“හා...හා මටත් නිදාගන්න කලින් ඔය විස්තර ටික කියන්නකෝ, දැන් අපි කෑම කාලා ඉඳිමුකෝ. ”

රෑට කෑම කාලා ඉවර වුණාට පස්සේ අපි අම්මාටත් අපි හොයා ගත්තු දේවල් ටික කියා දුන්නා.

ඔන්න ඉතින් ඊළඟ දවසෙත් මමයි මල්ලියි බිංකුඩු වළවල් තියෙන තැනට ගියා. එතන මැරුණු කුඹි දෙතුන් දෙනෙකුගෙයි මැරුණු කෑමි

සතුන් දෙතුන් දෙනෙකුගෙයි ඇඟවල්වල කොටස් තිබුණා. අපිට තේරුණා වෙලා තියෙන දේ.

“මල්ලි අර බලන්න, මම හිතන්නේ අර බිංකුණ්ඩා කාලා දාපු සත්තු.” මම කිවුවා. “ඒක තමයි, බිංකුණ්ඩා සතුන්ගේ යුෂ උරා බීලා එළියට විසි කරලා නේද?” මල්ලි ඇහුවා. “හ්ම්...ඒ වගේ.” මමත් කිවුවා.



අපිට ගොඩක් දුක හිතුණා, මේ මැරිලා හිටපු සත්තු ගැන. තමන්ගේ ඇඟ කොයිතරම් පුංචි වුණත් , බිංකුණ්ඩාට තියෙන මොළේ නම් හරි ම ලොකුයි කියලයි අපි දෙන්නටම හිතුණේ .

පුංචි වුණත් හරි ම සැරයි ගම්මිරිස් ඇටේ නේද?

ඔන්න ඉතින් ඊළඟ දවසෙත් අපි බිංකුඩු වළවල් නිරීක්ෂණය කරද්දි දැක්කා , එක කුඹියෙක් වළකට වැටිලා ගොඩට එන්න දඟලනවා.

“අනේ අක්කේ අර බලන්න, කුඹියෙක් අර වළට වැටිලා... අර බිංකුණ්ඩා ඌට වැලි ගහනවා” මල්ලි කිවුවා.

"අනේ ඔච් මල්ලි, එන්න, අපි එයාව බේරා ගනිමු, ඉක්මනටම." මම කිවුවා.

මමයි මල්ලියි ඉක්මනට ම එතෙනට ගිහින් ඒ කුඹියාව ගොඩට ගත්තා. ඊට පස්සේ ඒ කුඹියා එයාගේ අනිත් කුඹි රංචුව ඉන්න තැනට ගියා. අපි දෙන්නට හරිම සතුටු හිතුණා. ඉතින් ඊට පස්සේ මල්ලියි මමයි එකතු වෙලා අපේ ඉස්කෝලේ වාර්ෂික විද්‍යා ප්‍රදර්ශනයට බිංකුණ්ඩා ගැන ලිපියක් හදන්න පටන් ගත්තා.

"එන්න මල්ලි, අපි බිංකුණ්ඩා ගැන ලිපියක් හදමු." කියලා මම මල්ලිත් එක්ක කාමරේට ගියා.

අම්මා අපි කොහෙ ද බලන්න කාමරේට එද්දි අපි දෙන්නා සැරටම වැඩ !

"මොනව ද දෙන්න එකතු වෙලා මේ කරන්නේ ?"

අම්මා ඇහුවා.




“ඒක තමයි මාත් මේ බැලුවෙ. මෙයාලා දෙන්නා මේ දවස් ටිකේම බිංකුණ්ඩා ගැන එක එක දේවල් හොයනවා. මාත් එක්ක පුස්තකාලෙටත් ගියා.”

තාත්තා අම්මත් එක්ක කිවුවා.

“අපි මේ විද්‍යා ප්‍රදර්ශනයට ලිපියක් හදනවෝ.”

මල්ලියි මමයි අපි දෙන්න ම එකවර කිවුවා.




...නිමි...



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)